## ඒකීය රාජ්‍යය හා යුද්ධය

මහින්ද රාජපක්ෂ මහතා ඒකීය රාජ්‍ය ප්‍රතිපත්තිය පිළිගැනීම හේතුවෙන් නැවතත් යුද්ධයකට එළඹෙන බව එ ජා පක්ෂයේ න්‍යායාචාර්යවරු මෙන් ම මන්ත්‍රීවරු ද කියති. ඔවුන්ට අවශ්‍යවන්නේ යුද්ධයේ බිල්ලා මවාපාමින් ජනතාව බියගැන්වීම ය. ශ්‍රී ල නි පක්ෂයට ඡන්දය දුන්නොත් යුද්ධයක් අනිවාර්යයෙන් ම ඇතිවන්නේ යැයි ඔවුහු කියති. මෙහි දී පළමුවෙන් ම කිවයුතු කරුණක් වෙයි. යුද්ධය යන වචනය පහසුව සඳහා අප ද ඉඳහිට යොදාගත්ත ද සංකල්පීය වශයෙන් ගත්කල මෙහි කෙරෙන යුද්ධයක් නැත. යුද්ධ පවතින්නේ රටවල් දෙකක් හෝ රාජ්‍යයක් හා ආක්‍රමණිකයකු හෝ අතර සටන් ඇති විට ය. නැත්නම් වෙනත් එවැනි අවස්ථාවල ය. අද ලංකාවේ රාජ්‍ය දෙකක් නැත. ආක්‍රමණිකයකු ද නැත. කොටි ත්‍රස්තවාදීහු රට බෙදීම සඳහා ඒකීය රාජ්‍යයට එරෙහිව අවිගෙන සිටිති. අද සිදුකළ යුතුව ඇත්තේ ඔවුන් පරාජය කර ඒකීය රාජ්‍යය ආරක්ෂා කිරීම ය. එය යුද්ධයක් නො වෙයි. ජ වි පෙරමුණට එරෙහිව කළ රාජ්‍ය මෙහෙයුම් යුද්ධයක් යැයි හැඳින්වූවකු නොමැත. අද සිදුවන්නේ යුද්ධයක් නොවන බව ඊනියා සටන් විරාම ගිවිසුම ක්‍රියාත්මකවන ආකාරයෙන් ද පෙනෙයි. සටන් විරාමයක් ඇත්නම් ඒ දෙපාර්ශවයට ම එකසේ බලපෑ යුතු ය. යුද්ධයක් තිබියේ නම් දෙපැත්තම අද නිශ්ක්‍රීය විය යුතු ය. එහෙත් සිදු වී ඇත්තේ රාජ්‍ය හමුදා පමණක් නිශ්ක්‍රීයකිරීම ය. එනම් කොටින්ට විරුද්ධව හමුදා මෙහෙයවීම් නැවැත්වීම ය. එහෙත් කොටි මිනීමැරීම අත්හිටුවා නැත. බුද්ධි අංශයේ නියුතුවූවෝ දිනපතා මෙන් මරාදැමෙති. ඊනියා සටන් විරාමය ක්‍රියාත්මකකිරීමට නොහැකි වී ඇත්තේ යුද්ධයක් නොමැති වීම නිසා ය. සංකල්පීය නිරවුල්බව මෙවැනි අවස්ථාවල ද වැදගත්වෙයි. යුද්ධයක් නැති විටෙක සටන් විරාම ගිවිසුම් තිබිය නො හැකි ය. සංකල්පීය නිරවුල්බව නැතිවීම ද හේතුවෙන් ඊනියා සටන් විරාම ගිවිසුමක් හරහා රාජ්‍ය හමුදා නිශ්ක්‍රීයකිරීමට නෝර්වේ ඇතුළු බටහිර රටවල් සමත්විය. බටහිරයන් සමග කටයුතුකිරීමේ දී සංකල්පීය නිරවුල්බව ඉතා වැදගත්වෙයි. හමුදා මෙයෙහවා කොටි පරාජයකිරීම අද අවශ්‍යතාවක් වෙයි. ඒ අවශ්‍යතාව ඊනියා යුද විරෝධී ව්‍යාජ මානව හිතවාදයක් (මෙය මානව හිතවාදයක් නොව ඩොලර් හා සම්මාන හිතවාදයකි) මගින් යටපත්කිරීමට වෙරදැරීම බටහිර යටත්විජිතවාදය ඉදිරියේ දණගැසීමක් වෙයි.

කොටි අවිගෙන ඇත්තේ ඒකීය රාජ්‍යයට විරුද්ධව ය. සාකච්ඡා මාර්ගයෙන් "ප්‍රශ්නය" විසඳාගැනීමට ඒකීය රාජ්‍යය ඉවත්කර ගැනීම ම කොටින්ට දණ නැමීමකි. ඉන් කියැවෙන්නේ සාකච්ඡා ඇරඹීමට ද පළමුව රජය පරාජය වී ඇති බව ය. කොටි ඒකීය රාජ්‍යයට විරුද්ධව අවි ගනිති. ඒ වහාම රජය ඒකීය රාජ්‍යය අත්හරියි. අඩු තරමින් වෘත්තීය සමිති ක්‍රියාමාර්ගයක දී හෝ එවැන්නක් සිදුවන්නේ ද? රනිල් වික්‍රමසිංහ මහතා මෙන් ම චන්ද්‍රිකා කුමාරතුංග මහත්මිය ද ඒකීය රාජ්‍යය අත්හැරීමෙන් පෙන්නුම්කරන්නේ ඔවුන් කෙතරම් දුරට බටහිරයන්ගේ මතවාදවලින් මෙහෙයවනු ලබන්නේ ද යන්න ය. දහනවවැනි සියවසේ බටහිර විද්‍යාවක සිර වී සිටින කසිකබල් මාක්ස්වාදී සමසමාජ පක්ෂය හා කොමියුනිස්ට් පක්ෂය ගැන කතාකිරීමෙන් වැඩක් නැත. ඔවුහු බටහිර අර්ථයෙන් පවා අවුරුදු එකසිය පණහකට පෙර යුගයක ජීවත්වෙති. යමකු කොටි සංවිධානය සමග සාකච්චා පවත්වන්නේ නම් ඒ කළ යුත්තේ ඔවුන්ගේ ප්‍රධාන ඉල්ලීම පිළිගෙන ද? කළ යුත්තේ එය නොව එහි විරුද්ධයයි. සාකච්ඡාකිරීමට අවශ්‍ය ම නම් ආයුධ රාජ්‍යයට භාරදෙන ලෙසට කොන්දේසි පැණවීම ය.

කොටි ඊනියා ප්‍රජාතන්ත්‍රවාදී මාවතට ගැනීමක් ගැන අද කතාකරන්නෝ වෙති. ඔවුන්ට අනුව ද කොටි ප්‍රජාතන්ත්‍රවාදී මාවතකට ගැනීමට ත්‍රස්තවාදීන් සමග සාකච්ඡා කළ යුතු ය. ජ වි පෙ අද ප්‍රජාතන්ත්‍ර මාවතට පැමිණ ඇති ආකාරයට කොටි ද සාකච්ඡා ඔස්සේ අනාගතයේ දී ඊනියා ප්‍රජාතන්ත්‍රවාදී මාවතට එනු ඇතැයි ඔවුහු කියති. එහෙත් 1987-89 සමයෙහි දී ජ වි පෙරමුණ සමග සාකච්ඡා කළයුතු යැයි කී මානවහිතවාදියකු නැත. ඒ වෙනුවට ඊනියා මානව හිතවාදීහු ප්‍රා සංවිධානය ගොඩනැගූහ. ප්‍රා සංවිධානයෙහි කටයුතු කළ අය අද එ ජා පක්ෂයේ ද ශ්‍රී ල නි පක්ෂයේ ද මාක්ස්වාදීන් අතර ද මෙන් ම ඊනියා පශ්චාත්මාක්ස්වාදීන් අතර ද මානව හිතවාදී සංවිධානවල ද වෙති. ඔවුන් ප්‍රා සංවිධානය ගොඩනැගුවේ ජ වි පෙ සමග සාකච්ඡාකිරීමට නො වෙයි. ජේ ආර් ජයවර්ධන ආණ්ඩුව ද, ඊනියා මානව හිතවාදීහු ද එක්ව ජ වි පෙ ඉතා අමානුෂික ආකාරයෙන් මර්දනය කළහ. ජ වි පෙ ප්‍රජාතන්ත්‍රවාදී මාවතට පැමිණියේ සාකච්ඡා ඔස්සේ නම් නොවන බව මානවහිතවාදීන්ද ඇතුළු වයස අවුරුදු තිහට වැඩි  අය දනිති.

© Prof. Nalin De Silva

මහින්ද රාජපක්ෂ මහතා බලයට පැමිණියහොත් යුද්ධයක් ඇතිවන්නේ යැයි කෑමොර ගසන්නන්ට කිවයුත්තේ ඒකීය රාජ්‍යය වෙනුවෙන් ඊනියා යුද්ධයක්, එනම් කොටින්ට විරුද්ධව මෙහෙයුම්, කිරීමට කොටි බලකෙරෙන්නේ නම් ඒ කළයුතු බව ය. ඊනියා යුද්ධයකට මගපාදන්නේ මහින්ද රාජපක්ෂ මහතා නොව කොටි හා ඔවුන්ට උල්පන්දම් දෙන බටහිරයන්, ඩොලර් හිතවාදී ඊනියා මානව හිතවාදීන්, සම්මාන හිතවාදී කසිකබල් චිත්‍රපට අධ්‍යක්ෂකවරු (මොවුන් අධ්‍යක්ෂණයෙන් කෙසේ වෙතත් රඟපෑමෙන් නම් දක්ෂයන් බව ඇතැම් සම්මාන උළෙලවල් වර්ජනයකිරීමෙන් හා ඇතැම් සම්මාන උළෙලවල දී කරන කියන දැයින් පෙනී යයි. ඇත්තටම මොවුන් පිටුපස ඇත්තේ සම්මාන දෙන අධ්‍යක්ෂකවරු ය. සැබෑ අධ්‍යක්ෂකයෝ ඔවුහු ම වෙති. මොවුහු නළුවෝ ම වෙති. මොවුන්ගේ ඊනියා අධ්‍යක්ෂණය ද ඩොලර්, සම්මාන හා බොරු වීරත්වය හමුවේ කෙරෙන රඟපෑමක් ම වෙයි. කාන්තා විමුක්තිය ගැන කතාකරන මොවුන්ගේ නිරුවත පෙනී යන්නේ ඔවුන් සෙබළුන්ගේ බිරියන් ගැන දරණ ආකල්පයෙනි. මොවුන්ට තම සෙළුව සම්මානයකින් වසාගත නො හැකි ය.) ඇතැම් සති අන්ත පත්තර කඩමාළුවල කර්තෘවරු ආදීන් ය. ඒකීය රාජ්‍යය අත්හැරීම යනු අවුරුදු දෙදහසකට වැඩි ඉතිහාසයක් දෙමළ ජාතිවාදය හා විජාතික බලවේග හමුවේ පාවාදීමකි. අප බොහෝ විට පෙන්වා දී ඇති පරිදි අපට ඒකීය රාජ්‍යය ලැබුණේ තුන්වැනි ජෝර්ජ් නම් එංගලන්තයේ රජුගෙන් නොව පණ්ඩුකාභය, දේවානම් පියතිස්ස හා දුටුගැමුණු යන රජවරුන්ගේ එක්සේසත් රාජ්‍යයෙනි. එක්සේසත් කීව ද ඒකීය කීව ද ඉන් කියැවෙන්නේ මුළු රාජ්‍යයට ම ඇත්තේ එකම ව්‍යවස්ථාදායකයක් බව ය. එනම් මුළු රටට ම බලපාන නීති සම්පාදනය කරන්නේ එක මධ්‍යස්ථානයකින් බව ය.

ඊනියා මානවහිතවාදීන් චිත්‍රපට නිෂ්පාදනයකරමින් හමුදාවට නින්දාකරන්නේත්, තුට්ටු දෙකේ මාක්ස්වාදීන් සිංහලයන්ට අපහාසකරන්නේත්, ඊනියා යුද විරෝධීන් මිනිසුන් යුද්ධයට බයකරන්නේත්, ඊනියා ගැටුම් නිරාකරණයකරන්නන් හමුදා බැරැක්කවලට ගොස් සටන් ගැන නොව සටන් නැවැත්වීම ගැන කතාකරන්නේත් (මොවුහු තමන් සිටින විශ්වවිද්‍යාලවල ගැටුම් නිරාකරණය නොකරති.) එක අරමුණකින් ය. ඒ හමුදාවේ මානසිකත්වය හා ශක්තිය දුර්වලකිරීමට හා සිංහලයන් නිවටයන් පිරිසක් බවට පත්කිරීමට ය. එවිට යම් ආණ්ඩුවකට බටහිරයන්ගේ අනුග්‍රහයෙන් කොටි ඉදිරිපත්කරන කොන්දේසිවලට විරුද්ධවීමට අවශ්‍ය වුවත් එසේ කළ නොහැකිවනු ඇත. හමුදාව මන්දෝත්සාහී කර ඇතිවිටක අවශ්‍යවුවත් කොටින්ට එරෙහිව මෙහෙයුම් කරන්නේ කෙසේ ද? ඊනියා මානව හිතවාදීන්ට අවශ්‍ය මෙරට ආත්ම විශ්වාසයක් නැති ඉතා දුර්වල හමුදාවක් පවත්වාගෙන යෑමට ය.

ඒ ජා ප කියන ලෙසට දෙමළ ජනතාවට ඇතැයි කියන මහා ප්‍රශ්නය සහසන්ධීය රාජ්‍යයක් ඇතිකිරීමෙන් විසඳන්නේ කෙසේ ද? අද මෙරට දෙමළ ජනයාගෙන් ඉතා වැඩි පිරිස ජීවත්වන්නේ උතුරු හා නැගෙනහිර පළාත්වලින් පිටත ය. දෙමළ ජනයාට ඇතැයි කියන ප්‍රශ්නය ඒ පළාත්වලින් පිටත සිටින දෙමළ ජනයාට ද තිබිය යුතු ය. උතුරු හා නැගෙනහිර පළාත් එක්කර සහසන්ධීය රාජ්‍යයක් පිහිටුවීමෙන් ඒ පළාත්වලට පිටින් සිටින දෙමළ ජනයාගේ තිබේ යැයි කියන ප්‍රශ්න විසඳීමට නො හැකි ය. දෙමළ ජාතිවාදීන් එවැනි විසඳුමකට එකඟ යැයි කීමෙන් පැහැදිළි වන්නේ ඊනියා විසඳුමක් මිස ප්‍රශ්නයක් නොමැති බව ය. දෙමළ ජනයාට දෙමළ වීම නිසා ම ඇති ප්‍රශ්නයක් නැත. මෙරට විසඳන්නට ඔය කියන අන්දමේ ප්‍රශ්නයක් නැත. එහෙත් මෙරට ප්‍රශ්නයක් නැතැයි අපි නොකියමු. බටහිරයන්ගේ උදවු උපකාර හා උසිගැන්වීම් හේතුවෙන් අද දෙමළ ජාතිවාදීහු රජයට විරුද්ධව කොටි සංවිධානය ලවා සිංහලයන්ට හා සිංහලත්වයට මෙරට හිමිතැන අහිමිකිරීමට කටයුතුකරති. අද බටහිරයෝ තවත් උපක්‍රමයක් අනුගමනයකිරීමට කටයුතුකරති. අප රටට ආධාර ලබාදෙන්නේ යැයි කියන රටවල නියෝජිතයන් කියා ඇත්තේ බටහිරට අවශ්‍ය සන්ධීය රාජ්‍ය ලබාදෙන ලෙස ය. මේ නම් රටේ ස්වෛරීභාවයට තර්ජනයකි. අප පළමුවෙන් ම කළ යුත්තේ මේ තර්ජනවලට නිසි පරිදි පිළිතුරු දීම ය. ඔවුන්ගෙන් වන හානිය  නැතිකිරීමට කටයුතු කිරීම ය. බටහිරයන්ගේ බලපෑම්වලට හසුනොවන ආකාරයෙන් ශක්තිමත් ආර්ථිකයක් ගොඩනගාගැනීමත් අපේ අවශ්‍යතා සීමාකරගැනීමත් ය.

අනෙක් අතට යම් අයුරකින් රනිල් වික්‍රමසිංහ මහතා බලයට පත්වී යැයි සිතමු (එසේ වීමට ඉඩකඩක් නැති වුවත් තර්කය සඳහා ඒ උපකල්පනය කරමු.) ඔහු තමාගේත් බටහිරයන්ගේ වුවමනාව නිසා දෙමළ ජාතිවාදයට සහසන්ධිය රාජ්‍යයක් දෙනු ඇත. එහි දී ජාතික බලවේග අනිවාර්යයෙන් ම ඔහුගේ පාවාදීමට එරෙහිව නැගී සිටිනු ඇත. එවිට ඊනියා යුද විරෝධී මහත්වරුන් හා නෝනාවරුන් ජාතික බලවේගවලට එරෙහිව පිටරටින් හෝ හමුදා ගෙන්වා අමානුෂික මර්දනයක් දියත් කරනු ඇත. ඒ මර්දනය හා අදාළ භීෂණය හමුවේ 1987-89 භීෂණය නොසළකා හැරිය හැකි එකක් වනු ඇත. එදාට අර මානව හිතවාදීන් බෙහෙතකටවත් සොයාගැනීමට නොහැකි වනු ඇත.

© Prof. Nalin De Silva